## දේශීය ණය සහ සංවර්ධන අරමුදල-2010 .

1. මූල්‍ය ප්‍රකාශන

----------------

1.1 මතය

------

මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව දේශීය ණය සහ සංවර්ධන අරමුදල 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1:2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.1 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

--------------------------------------

1.2.1 ගිණුම්කරණ ප්‍රතිපත්ත

-------------------------

මුළු හිඟ ණය ශේෂයන් මූල්‍ය ප්‍රකාශනවල ජංගම නොවන ණයගැතියන් ලෙස හඳුනාගෙන තිබුණි. වර්ෂ එකක කාල පරිච්ඡේදයක් ඇතුළත නිරවුල් කළ යුතු ණය වාරික ශ්‍රී.ල.ගි.ප්‍ර. 3 ප්‍රකාරව ජංගම ණයගැතියන් ලෙස දක්වා නොතිබුණි.

1.2.2 නොසැසඳූ වෙනස්කම්

-----------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශනවල සටහන් සමඟ උපලේඛන සැසඳීමේදී පහත දැක්වෙන වෙනස්කම් නිරීක්ෂණය විය.

| විෂයය | සටහන්වලට අනුව මුදල | උපලේඛනවලට අනුව මුදල | වෙනස |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| ප්‍රාදේශීය සභා ණයගැති ශේෂය (සටහන් 2) | 402,878,727 | 403,021,352 | 142,625 |
| ලැබුණු පොලී (සටහන් 5) | 22,542,923 | 22,545,037 | 2,114 |

## 1. මූල්‍ය ප්‍රකාශන

----------------

### 1.1 මතය

-------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.2 ජේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-----------------------------------------

#### 1.2.1 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

(අ) උසස් ගිණුම්කරණ පරිචයන්ට අනුව ගොඩනැගිලි වලට අදාල දැනට කෙරීගෙන යන වැඩ වටිනාකම වූ රු. 9,314,164 ක් ශේෂපත්‍රයේ ස්ථාවර වත්කම් වලට පහලින් වෙනම අයිතමයක් ලෙස දක්වා නොතිබුණු අතර ස්ථාවර වත්කම් වටිනාකමට එකතු කර තිබුණි.

(ආ) ශ්‍රවණාගාරයට අවශ්‍ය පුටු සඳහා ගෙවන ලද රු. 861,821 ක අත්තිකාරම් මුදල් ද ගොඩනැගිලි කෙරීගෙන යන වැඩ යටතේ ගිණුම් ගත කර තිබුණි.

#### 1.2.2 ලැබිය යුතු ගිණුම්

--------------------

රු. 1,810,760 ක් වූ ණයගැති ශේෂය තුල රු. 316,434 ක් වූ ශේෂ වර්ෂ දෙකකට වැඩි කාලයක්ද, රු. 1,494,326 ක් වූ ශේෂ වර්ෂයකට වැඩි කාලයක සිට අයවීමට තිබුණි.

#### 1.2.3 නොසැසඳුනු ගිණුම්

----------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශයේ දැක්වෙන රු. 169,729,449 ක් වූ අයෝජන ගිණුම් 05 කට අදාලව එම ආයතන වලින් ලබාගත් ශේෂ තහවුරු කිරීම්වල රු. 28,793 වෙනසක් දැක්වුනද, එම වෙනස හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 1.2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

------------------------------------------------------------------------

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි හා කලමනාකරණ තීරණ වලට යොමුව | | | අනුකූල නොවීම |
|---|---|---|---|
| (අ) | 1988 අංක 53 දරන පනත හා 1999 අංක 9 දරන ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය සංශෝධිත පනත - 3 වගන්තිය | | විගණනය කිරීමේ දී සුදුසුකම් ලත් විගණකයෙකු සහයට පත්කර ගැනීමට හා ඔහුව මෙහෙයවීමට අධිකාරය විගණකාධිපතිට පවරා තිබුණද අවස්ථා 3 ක දී ව්‍යාපෘති 3 කට අදාල විගණනයන් විගණකාධිපතිගේ අවසරය නොමැතිව පෞද්ගලික විගණන සමාගමක් වෙත පවරා තිබුණි. |
| (ආ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලෙඛය | | |
| | i. | 9.2 (බී) ජේදය | කාර්ය මණ්ඩලය අනුමතකර ගෙන නොතිබුණි. |
| | ii. | 9.3(i) ජේදය | ආයතනයේ බඳවාගැනීම් හා උසස් කිරීමේ පරිපාටි සඳහා අමාත්‍යාංශයේ අනුමැතිය සහ එයට රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ එකඟතාවය ලබාගෙන නොතිබුණි. |
| | iii. | 9:14:2 ජේදය | මානව සම්පත් කළමනාකරණය සඳහා කාර්ය පරිපාටි සංග්‍රහයක් පිළියෙල කර ක්‍රියාත්මක කර තිබුණත් ඒ සඳහා භාණ්ඩාගාර ලේකම්ගේ හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ එකඟතාවය ලබා නොතිබුණි. |
| (ඇ) | 2009 මැයි 26 හා අංක 39 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය. | | බඳවා ගැනීමේ පරිපාටි කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත කරගෙන නොතිබුණු අතර සේවකයින්ට ගෞරවාන්විත දීමනා ලෙස රු. 2,248,069 ක් ගෙවා තිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | 1994 ජුනි 14 දිනැති අංක පීඑෆ්/පීර් 95 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛය. | පූර්ව අනුමැතිය ලබානොගෙන නිලධාරීන්ට රු. 268,621 ක මුදලක් 2010 අප්‍රේල් මස ප්‍රසාද දීමනා ලෙස ගෙවා තිබුණි. |
| (ඉ) | 1998 අප්‍රේල් 20 දිනැති අංක 30/94 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය. | ගොඩනැගිලි අරමුදල සඳහා විදේශ ප්‍රදාන ලැබීමේදී ඒ සම්බන්ධයෙන් සියළු ගනුදෙනු මහා භාණ්ඩාගාරයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හරහා සිදු කළ යුතු වුවද රු. 13,214,520 ක් වූ ප්‍රදාන ආයතනයට සෘජුවම ලැබී තිබුණි. |
| (ඊ) | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4 වගන්තිය. | රු. 66,358,610 ක කොන්ත්‍රාත්තුවක වටිනාකමින් 20% ක් ඉක්මවා අත්තිකාරම් ගෙවා තිබුණු අතර, ඒ සඳහා ඇප සුරක්ෂණයක් ලබා ගෙන නොතිබුණි. |

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය සමාලෝචනය

#### 2.1.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 26,294,271 ක ඌනතාවයක් වූ අතර, ඊට ප්‍රතිරූපව ඉකුත් වර්ෂයේදී රු. 25,643,254 ක අතිරික්තයක් වූ බැවින් මූල්‍ය ප්‍රතිඵලයේ රු. 51,937,525 ක පිරිහීමක් පෙන්නුම් කෙරේ. මෙම පිරිහීම කෙරෙහි රජයේ දායකය, පොලී ආදායම හා කොන්ත්‍රාත් ප්‍රමාද ගාස්තු ලැබීම් වශයෙන් එකතුව රු. 40,509,897 කින් අඩුවීමද සේවක වියදම්, ක්ෂය වීම්, සම්මන්ත්‍රණ හා වැඩමුළු වියදම්, උපයෝගිතා වියදම් හා මෙහෙයුම් වියදම් වශයෙන් එකතුව රු. 13,781,174 ක් වැඩි වීමද හේතුවී තිබුණි.

### 2.2 මෙහෙයුම් සමාලෝචනය

#### 2.2.1 කාර්ය සාධනය

සමාලෝචිත වර්ෂය තුල සපුරාගත යුතු ඉලක්ක ක්‍රියාකාරී සැලැස්මේ අන්තර්ගත කොට නොතිබූ හෙයින් තත්‍ය කාර්ය සාධනය සැසදීමක් කල නොහැකි විය.

### 2.2.2 හඳුනා ගන්නා ලද පාඩු

---------------------------

(අ) ව්‍යාපෘති සඳහා මුදල් ලබාගැනීමට ඉන්වොයිස් කර එම මුදල් ලැබෙන අවස්ථාව වන විට විදේශ මුදලට සමානුපාතිකව රුපියලේ අගයෙහි වෙනස්වීම් ගැලපීමෙන් පසු රු. 2,864,421 ක විනිමය අලාභයක් සිදුවී තිබුණි.

(ආ) 2008 වර්ෂයේදී මධ්‍යසාර භාවිතය සම්බන්ධයෙන් වූ ව්‍යාපෘතියකින් ලැබිය යුතු රු. 520,000 ක් නොලැබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුලදී එම මුදල බොල්ණය ලෙස ආදායමින් ලියා හැර තිබුණි.

### 2.2.3 අභ්‍යන්තර විගණනය

-----------------------

සමාලෝචිත වර්ෂයට අදාලව අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මක වී නොතිබුණි.

### 2.2.4 විගණන හා කළමනාකරණ කමිටු

--------------------------------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයට අදාලව විගණන හා කළමනාකරණ කමිටුවක් පිහිටුවා නොතිබුණි.

## 3. පද්ධති හා පාලන

--------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර ආයතනයේ සභාපති වෙත යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ගිණුම්කරණය

(ආ) ණය ලිපිගොනු